# සන්නස

Sannasa
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රචා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**

**S Jayasinghe**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**Kuma Gamage**
0414 215 280
**email** kuma.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**ඡේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත



**Delay of justice is injustice**
**WALTER SAVAGE LANDOR**
Imaginary Conversations

## ලියා දන්වන වගයි

### තවත් කාන්තා දිනයක්

ලෝ කයේ කාන්තාවන් අතින් සමාජයට සිදුවන වැඩ කොටස ප්‍රතිශතයනක් වශයෙන් කොපමණ වේදැයි ඔබට පිළිතුරක් දිය හැකිද? එය ප්‍රමාණයෙන් 67% වේ යයි ඔබ කෙදිනක හෝ සිතුවාද? පිරිමින් විසින් සමාජයට කරනු ලබන වැඩ කොටස 33% වන විට ඔවුන් විසින් කාන්තාවනට පමුණුවන නීති රීති ද හිංසනයද ඊට ඇතුළත් වේය යන්නට ඔබ එකඟ වන්නේද? ඔබ කැමතිවුවත් නැතත් ලෝකය පුරා වැඩකරන ජනතාව ඇතුළත් කොට කෙරුණ සමීක්ෂණයේ අවසන් සත්‍ය ප්‍රතිඵලය එයයි.

ලෝකය පුරාම පුරුෂාධිපත්‍යය ලෙස අර්ථ ගැන්වෙන්නේද මෙයයි. එය විවිධ රටවල් හා සංස්කෘතීන් අනුව අඩන්තේට්ටම් අපයෝජනය වද හිංසා ආදිය ලෙස පැතිරී ගොස් තිබේ. ලෝකය පුරාම පොදුවේ කාන්තාවන් විඳින මේ හිංසනයෙන් ඔවුන් ගලවා ඔවුනට සමතැන් දෙන අරමුණෙන් ඔවුන් දැනුවත් කිරීමේ පරමාර්ථයෙන් සෑම වසරකම මාර්තු 8 ලෝක කාන්තා දිනය වශයෙන් නම් කර තිබේ.

මේ එළැඹෙමින් තිබෙන්නේ 2014 වර්ෂයේ ඒ දිනයයි. ශ්‍රී ලාංකීය අපි ලෝකයට ප්‍රථම කාන්තා අගමැතිවරිය තිළිණ කළ ජාතියද වන්නෙමු. අද අපට වෙනම කාන්තා කාර්යාංශයක්ද තිබේ. සේවා වනිතා ඒකකයක්ද තිබේ. කාන්තා ඇමතිනියන් ද ස්වේච්ඡා සංවිධානද රාශියක් තිබේ. දැනට දශක තුන හතරක සිට ජාත්‍යන්තර කාන්තා දිනය මහත් උත්කර්ශවත් අන්දමින් සමරමින් සිටින්නෙමු. එහෙත් මේ සියල්ලෙහි සැබෑ ප්‍රතිඵලය කෙසේ දැයි යන්න අවබෝධ කර ගැනීමට සතියක පමණ දිනපතා පුවත්පත් වල පළවන කාන්තා හිංසා දූෂණ අපචාර පිළිබඳ ලිපි දෙස බැලීමෙන් අවබෝධ කර ගත හැකිය.

අපේ රටේ හිංසනයට එරෙහිව දැඩි නීති රීති පනවා තිබේ. ඊට එරෙහිව නොයෙකුත් සංවිධානද තිබේ එහෙත් පීඩාවට පත් වන කාන්තාවන්ගේ ප්‍රශ්නය දිනෙන් දින වැඩි වෙමින් තිබේ. හිංසනයෙන් දූෂණයෙන් අපචාර වලින් තොර ලොවක ජීවත්වීම යන්න කාන්තාවන් වෙනුවෙන් පෙනී සිටින කාන්තාවනට කෙසේ වුවත් අපේ රටේ සාමාන්‍ය කාන්තාවනට එය සිහිනයක් වීම කොතරම් ඛේදජනකද?

දිනෙන් දින උග්‍ර වන මේ තත්වය සමනය කර ගැනීම සඳහා අප කුමක් කළ යුතුද? කාන්තා හිංසනයෙන් තොර සමාජයක් වෙනුවෙන් ඔබ ගෙන් ඉටු විය යුතු යුතුකම් මොනවාද? මේ සියල්ල මෙවන් දවසක කල්පනා කළ යුතුය.

### විවේචන නුරුස්සන සමාජයක් අයාලේ යන සමාජයකි

ඕනෑම සමාජයක යහපැවැත්ම සඳහා නිවැරදි වීමේ යාන්ත්‍රණයක් තිබිය යුතුය. විවේචනය යනු ඒ යාන්ත්‍රණයේ වැදගත්ම අංගයකි. විවේචනයකින් තොර සමාජයක් අයාලේ යන සමාජයක් බවට පත් වීම නියතය.

අද අප දකින්නේ විවේචන නුරුස්සන සමාජයකි. රාජ්‍ය පාලකයාගේ සිට පහළ මට්ටම දක්වාම සියල්ලෝම විවේචන නුරුස්සති. සෑම සියළු දේශපාලන පක්ෂයකටම මෙට පොදුය. පාලක පොදු පෙරමුණේ සිට ජවිපෙ දක්වාම කිසිවකු විවේචන නුරුස්සති. විවේචකයා සතුරකු ලෙස සළකති. මේ දුර්වල සහ නොපැසුණු මානසිකත්වය පවතින තාක් කිසිදු පුද්ගලයකුට සමාජයකට හෝ සමාජ සංවිධානයකට පිරිසිදු ගමනක් යා නොහැකිය.

විවේචකයා කරන්නෙ යහපත් කාරියකි. ඒ වෙනුවෙන් ඔහු අවදානමක්ද දරයි. ඒ අවදානම දරා ගනිමින්ම විවේචකයා යමක් පෙන්වා දෙන විට බුද්ධිමත් මිනිසුන් බැලිය යුත්තේ විවේචකයාගේ ඇඟිල්ල දෙස නොව ඔහු පෙන්වා දෙන දෙය දෙසය.

සංස්කාරක

# අඩමානයක් තිබේ නම්, හයියෙන් කෑගහන්න



**ගාමිණී වියන්ගොඩ**

අද ආණ්ඩුවේ සිටින, යටිගිරියෙන් කෑගහන බොහෝ දේශපාලඥයන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ දේශපාලනයට හතුරු දේශපාලනයක් තුළ පන්නරය ලැබුවන් බව, ඒ දෙස විමසිල්ලෙන් බැලුවොත් කෙනෙකුට පෙනී යනු ඇත. ඊට හේතුව, එවැනි දේශපාලඥයන්ට වගකීම් දෙකක් තිබීමයි.

එකක්, වර්තමාන දේශපාලනය නිවැරදි බව දිවිරා සපථ කිරීමේ අවශ්‍යතාවයි. ඒ සඳහා විවිධ හේතුවාචක ඉදිරිපත් කෙරේ■ ත්‍රස්තවාදය පරාජය කිරීම්, ජනාධිපතිවරයාගේ දෑත ශක්තිමත් කිරීම් සහ විදේශ කුමන්ත්‍රණ පැරදවීම් ආදී වශයෙනි.

දෙවැන්න වන්නේ, තමාගේ වර්තමාන දේශපාලනය, කලින් සිටි පක්ෂයේ වරදක සෘජු ප්‍රතිඵලයක් මිස වෙන කිසිවක්ම නොවන බවත්, පිටස්තර ලෝකයාට මෙන්ම තමාටමත් ඒත්තු ගැන්වීමයි. මීට හොඳම නිදසුන වශයෙන් නිතැතින් මගේ හිතට එන්නේ විමල් වීරවංශයි. දයාසිරි ජයසේකරට නොපැවරෙන බරක්, වර්තමානය යුක්ති සගහත කර ගැනීම සඳහා, විමල් වීරවංශට පැවරෙයි. මන්ද යත්, ඔහු සම්බන්ධයෙන් කඩඉම් දෙකක් ඇති බැවිනි. දයාසිරි පනින්නේ, එක ධනපති පක්ෂයකින් තවත් ධනපති පක්ෂයකට හෙවත් අල්ලපු වත්තට ය. එය අමාරු නැත. එහෙත්, මාක්ස්වාදී සහ විප්ලවවාදී යැයි කියාගත් පක්ෂයකින් ධනපති පක්ෂයකට පැනීම යනු, යුක්ති සහගත කර ගැනීම සඳහා වන් ගෙදර වැඩ බොහොමයක් පැවරෙන, වෙහෙසකර අභ්‍යාසයකි. (කාලයකින් පසු, එනම් ඇටුවම් බැස්ස පසු, මේ තත්වය සමනය විය හැකිය. එවිට, තමන් කලින් සිටියේ කොහේද යන්නත් කෙනෙකුට අමතක වී යයි). මේ නිසා, කෑගැසීමක් කොහෙත්ම අවශ්‍ය නොකරන විෂයක් ගැන කතා කිරීමේ දී පවා, ගිරිය පුම්බන දේශපාලඥයන් ගැන පරිස්සමෙන් සිටීම යෙහෙකි. (කෙසේ වෙතත්, මීට ප්‍රතිපක්ෂව, ධර්මානුශාසනාවෙන් කරුණු ගෙනහැර දක්වන්නන්, අවංක සහ අව්‍යාජ පිරිසක් යැයි අනිවාර්යෙන් ගැනෙන බවක් මෙයින් අදහස් නොවන බවත් දත යුතුය■ උදාහරණ■ ජී. එල්. පීරිස්).

යුද්ධයේ අවසන් වකවානුවේ යුද අපරාධ සහ බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් සිදුවන්ට ඇති බව, සාධාරණ පදනමකින් අනුමාන කරන්ට, කෙනෙකු උතුරේ වැසියෙකු හෝ දෙමළ ජාතිකයෙකුම විය යුතු නැත. 1971 දී එවැනි යුද අපරාධ සිදුවිය. එයින් ප්‍රසිද්ධියට පත් එක් අවස්ථාවක් වන්නේ, කතරගම ප්‍රේමවතී මනම්පේරි නැමැති තරුණියව,

4 වන පිටට